සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය — පැය 01 යි
கண்டுபிடிப்பு சோதனை — 01 மணி
Diagnostic Test — 01Hour

ඉතිහාසය 1 — 10ශ්‍රේණිය
வரலாறு 1 — தரம் 10
History 1 — Grade 10

උපදෙස් :

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශන් වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පි ළිතුර තෝරන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.

(01) මහා වංශයෙහි අර්ථ විවරණය සඳහා රචනා කොට ඇති ග්‍රන්ථය මින් කුමක්ද?

1. සීහලට්ඨකතා මහා වංශය
2. වංසත්ථප්පකාසිනිය
3. රසවාහිනිය
4. සමන්ත පාසාදිකාව

(02) නැචුරාලිස් හිස්ටෝරියා නම් රෝම මූලාශ්‍රය රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද?

1. ප්ලීනි
2. ටොලමි
3. ක්වේරෝස්
4. ඇරිස්ටෝටල්

(03) විවිධ ජන වර්ග ජීවත්වන සමාජයකට ඉතිහාසය ඉගෙනීමෙන් ලැබෙන වැදගත්ම ප්‍රයෝජනය වන්නේ,

1. අතීතය තුළින් වර්තමානය අවබෝධ කර ගැනීමට
2. අනාගත නායකත්වය බාර ගැනීමට
3. කාලය හා අවකාශය ගැන දැන ගැනීමට
4. ජාතික සමඟිය ගොඩ නැගීමට

(04) ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනගා ගැනීමේ දී ශිලා ලේඛන වඩාත් වැදගත් වීමට හේතුව,

1. බෞද්ධ සිද්ධස්ථානයන්ට කරන ලද දීමනා ගැන තොරතුරු ලැබෙන නිසා ය.
2. සමාජ හා ආර්ථික තොරතුරු බහුල වීම නිසා ය.
3. විශ්වාසදායක වීම හා සිද්ධීන්ට සමකාලනී වීම නිසා ය.
4. කෙටි හා අඛණ්ඩ ඓතිහාසික තොරතුරු සැපයීම නිසා ය.

(05) ලාංකිකයන්ගේ ජාතික උරුමයක් වූ පුරාවස්තු රැක ගැනීම කළ යුතු වන්නේ,

1. මතු පරපුරට පෙන්වීම සඳහා ය.
2. අතීත පාලකයින්ගේ කටයුතු ගැන අවබෝධයක් ලබාගත හැකි නිසා ය.
3. සංචාරක ව්‍යාපාරයේ වර්ධනයට හේතුවන නිසා ය.
4. ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්නුම් කිරීමට හේතුවන නිසා ය.

(06) පැරණි ප්‍රාදේශීය මායිම් පෙන්වන රූප සටහනක් නොවන්නේ,

1. දුන්න
2. කෙටේරිය

3. ඊතලය 4. හක්ගෙඩිය

(07) මීට වසර 38000 කට ඉහත කාලයේ දී ප්‍රාග් ඓතිහාසික මානවයාගේ වාසස්ථානයක්ව පැවති බවට පුරාවිද්‍යාත්මක තොරතුරු වලින් තහවුරු වී ඇති ගල් ලෙනක් වන්නේ,

1. පාහියන්ගල
2. කුරුවිට බටදොඹ ලෙන
3. කිතුල්ගල බෙලිලෙන
4. අත්තනගොඩ අළුලෙන

(08) තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් වන්නේ,

1. බූන්දල
2. සීගිරියේ පොතාන
3. බෙල්ලන්බැඳි පැලැස්ස
4. හෝර්ටන්තැන්න

(09) පූර්ව ඓතිහාසික යුගයේ සිදු වූ වැදගත් සිදුවීමක් වන්නේ,

1. ආහාර පුළුස්සා අනුභව කිරීම ආරම්භ කිරීම.
2. තිරුවානා හා කහඳගල් භාවිතා කොට ක්ෂුද්‍ර ගල් මෙවලම් නිෂ්පාදනය කිරීම.
3. ක්‍රමයෙන් ගල් ආයුධ තාක්ෂණයෙන් මිදී ලෝහ හා මැටි බඳුන් නිපදවීමේ තාක්‍ෂණය වෙත පරිවර්තනය වීම.
4. විවිධ දේශගුණික කලාපවලට අනුවර්තනය වෙමින් පුළුල් භූගෝලීය ප්‍රදේශයක ව්‍යාප්ත වීම.

(10) මුල් ඓතිහාසික යුගය වශයෙන් සැලකෙන්නේ,

1. ක්‍රි. පූ. 450 ට පෙර අවධිය යි.
2. ක්‍රි. පූ. 450 පමණ සිට ක්‍රි. ව. 300 වන තුරු කාලය යි.
3. ක්‍රි. ව. 300 ට පසු අවධිය යි.
4. ක්‍රි. ව. 450 සිට ක්‍රි. ව. 900 දක්වා කාලය යි.

(11) පහත "අ" සහ "ආ" තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| 1 ගමත් පුරයත් අතර වූ ජනාවාසයකි | A ගමින |
| 2 වැවක් කේන්ද්‍ර කොටගෙන වර්ධනය වූ ජනාවාස | B පුරකමත |
| 3 ගමේ ප්‍රධානියා | C නකර |
| 4 නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා | D වාපිගාම |

1. B D C A
2. A B C D
3. D C A B
4. C D A B

(12) බ්‍රාහ්මීය සෙල්ලිපිවල (අවරණ) අමුණ නමින් හඳුන්වා ඇති සෙල්ලිපිය අයත් පිළිතුර වනුයේ,

1. ගනේකන්ද, ගල්ලෙන විහාර ලිපිවල
2. දඹුලු ලිපිය
3. කණ්ඩලම ලිපිය
4. කොත්ගල්කන්ද ලිපිය

(13) භෂ්මාවශේෂ සහිත කුඩා මැටි බඳුන් විශාල මැටි බඳුනක් තුළ බහා තැන්පත් කිරීම හඳුන්වනු ලබන්නේ,

1. මහාශිලා සුසාන
2. හරණි සුසාන
3. මැටි ඔරු සුසාන
4. ගල්සොහොන් සුසාන

(14) පැරණි සමාජයේ ගමකට නායකත්වය සැපයූ "ගමික" සතු කාර්යයක් නොවන්නේ,

1. ගමේ පොදු වැඩකටයුතුවලට නායකත්වය දීම.
2. ගමට අයත් වැව් නඩත්තු කිරීම.

3. රාජ්‍ය උපදේශකයෙකු ලෙස කටයුතු කිරීම.
4. ගමේ සමගිය පවත්වාගෙන යාම.

(15) පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම්, ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව දැක්වූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

A - ශ්‍රී මහා බෝධිය රෝපණය කිරීම.
B - සිය පාලන මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරය තෝරාගෙන අනුරාධපුර නගරය ගොඩනැංවීම.
C - පරිපාලන දිස්ත්‍රික්ක (අස්ථාන) වෙන්කොට ඒ එක් එක් දිස්ත්‍රික්ක පාලනය කිරීමට ඇමතිවරුන් පත් කිරීම.
D - විමධ්‍යගතව තිබූ දේශපාලන බලය මධ්‍යගත කොට රට එක්සේසත් කිරීම.

1. D A B C
2. C A D B
3. A B C D
4. B A D C

(16) දඹුලු විහාරයේ පර්වතයක ඇති සෙල්ලිපිය පිහිට වූ කුටකණ්ණ අභය රජු එහි තමන් හඳුන්වාගෙන ඇත්තේ,

1. පර්වත රාජ ලෙස ය.
2. නරේශ්වර ලෙස ය.
3. චක්‍රවර්තී ලෙස ය.
4. ආලකමන්දාධිපති ලෙස ය.

(17) අනුරාධපුරය වෙනුවට පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය බවට පත් කරගත් ප්‍රථම රජු කවුද?

1. වළගම්බා රජු
2. වසභ රජු
3. I වන විජයබාහු රජු
4. I පරාක්‍රමබාහු රජු

(18) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු ගොඩ නැගුණු රාජ්‍යය පරිපාලන සැකැස්මට අයත් වූ නිලධාරීන් අතරින් "චත් සිරිත් සහ චාරිත්‍ර පිළිබඳ අධිකාරී" යන්න සෙල්ලිපිවල සඳහන් වන්නේ,

1. කොතුරුගෑනා
2. බතගු
3. නගරගුතික
4. කනපෙඩික යනුවෙනි.

(19) වසභ රජුගේ පාලන සමයේ දී නාගදීපය පාලනය කළ ඍෂිගිරි නම් ඇමති විසින් එහි "පියංගුකතිස්ස" නම් විහාරය ඉදිකළ බව සඳහන් වන්නේ,

1. වල්ලිපුරම් රන්පතේ
2. පනාකඩුව තඹ සන්නසේ
3. කළුදිය පොකුණ සෙල්ලිපියේ
4. බදුලු ටැම් ලිපියේ

(20) මෙරට පැරණිතම ගොවිතැන වූ හේන් ගොවිතැන හැඳින්වීමට බුත්සරණ නම් සාහිත්‍යය කෘතියේ, උම්මග්ග ජාතකයේ සහ සෙල්ලිපිවල හඳුන්වා ඇති ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

1. පිට්බිම්, සේන්, සෙහෙන්
2. සේන්, පිට්බිම්, සෙහෙන්
3. සෙහෙන්, සේන්, පිට්බිම්
4. පිට්බිම්, සෙහෙන්, සේන්

පහත වගුවේ සඳහන් ˀ සිට ෂ තෙක් ඇති තොරතුරු ඇසුරින් 21, 22 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

| කර්මාන්තය | සෙල්ලිපිවල හැඳින්වූ නම | සෙල්ලිපිය පිහිටි ස්ථානය |
|---|---|---|
| A යකඩ | D දටික | G පොළොන්නරුවේ මුතගු ල්ල |
| B රන් | E කබර | H මහනුවර වේගිරිය |
| C ඇත්දළ | F තුලාධාර | I හම්බන්තොට මණ්ඩගල |

(21) ඇත්දළ කර්මාන්තය සෙල්ලිපිවල හඳුන්වන නම හා එම සෙල්ලිපිය පිහිටි ස්ථානය ඇතුළත් අක්ෂර යුගලය,

1. D G
2. D H
3. F I
4. E H

(22) "තුලාධාර සුමන" නමින් සෙල්ලිපිවල සඳහන් නාමය හා සම්බන්ධ අක්ෂර සඳහන් පිළිතුර,

1. A E H 2. C F G 3. B D H 4. B F I

(23) වැඩි දෙනෙකුගේ කැමැත්ත මත රට පාලනය කළ තැනැත්තා හැඳින්වූ නාමය කුමක් ද?

1. පරුමුක 2. මපුරුමුකා 3. මහා සම්මත 4. ගමික

(24) අහසින් වැටෙන එක දිය බිඳක් වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතුය" යන ප්‍රකාශය සිදු කළ මෙරට සිටි ශ්‍රේෂ්ඨ නරපතියා,

1. දුටුගැමුණු රජු 2. මහා පරාක්‍රමබාහු රජු 3. මහසෙන් රජු 4. වසභ රජු

(25) පැරණිතම අරාබි භූගෝල විද්‍යා ග්‍රන්ථය වූ කිතබ්-අල්-මස්ලික්වාල්-මමාලික් නම් කෘතියේ ශ්‍රී ලංකාව හඳුන්වා ඇත්තේ,

1. තැප්‍රොබේන් 2. පාරසමුද්‍ර 3. සරන්ඩිබ් 4. රතුකැට දිවයින

(26) අතීත ශ්‍රී ලංකාවේ පැවති ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථාන අතරින් සුවිශේෂී ආයතන දෙකකි,

1. මහා විහාරය හා අභයගිරිය
2. ඉසුරුමුණිය හා අභයගිරිය
3. මහා විහාරය හා මිරිසවැටිය
4. ජේතවනාරාමය හා අභයගිරිය

(27) ඉන්දියානු කුලී භේවායින්ගේ සහාය පැතූ පැරණිතම ශ්‍රී ලාංකික පාලකයා වන්නේ,

1. I වන විජයබාහු රජු 2. IV වන කාශ්‍යප රජු 3. අභයනාග රජු 4. ඉළනාග රජු

(28) වෙරයොදා බලයක් යෙදීමෙන් ගල් පතුරු ගලවාගෙන මෙවලම් තැනීමේ තාක්ෂණය හැඳින්වීමට යොදන පදය,

1. ගුරුත්වාකර්ෂණය යි
2. විද්‍යුත් ශක්තිය යි
3. පීඩන ශලක්නය යි
4. චාලක ශක්තිය යි

(29) මහවැලි ගඟේ අතු ගංගාවක් වූ අඹන්ගඟ හරස්කර ඉදිකළ ඇළ මාර්ගය,

1. යෝධ ඇළ 2. ඇළහැර ඇළ 3. රිදී බැඳි ඇළ 4. පබ්බතන්ත ඇළ

(30) පැරණි වාස්තු විද්‍යාඥයින් උස ගොඩනැගිලි අකුණු සැරවලින් ආරක්ෂා කර ගැනීම සඳහා භාවිතා කළ උපකරණය හඳුන්වන්නේ,

1. දියකැට පහන නමින් ය.
2. මොහොල නමින් ය.
3. එල්ලංගාව නමින් ය.
4. වජ්‍ර චුම්බට නමින් ය.

(31) අතීතයේ දී "ගව්ව" යන මිනුම භාවිතා කරන ලද්දේ,

1. දිග දුර මැනීමට
2. කෙටි දුර මැනීමට
3. කාලය මැනීමට
4. බර මැනීමට

(32) ගවයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් සිදු කරනු ලබන කිරිමඩු ශාන්ති කර්මය අද වන විටත් දැකගත හැකි ප්‍රධාන පළාත් 2 කි,

1. මධ්‍යම පළාතේ සහ ඌව පළාතේ
2. දකුණු පළාතේ සහ මධ්‍යම පළාතේ
3. සබරගමුව පළාතේ සහ ඌව පළාතේ
4. මධ්‍යම පළාතේ සහ සබරගමුව පළාතේ

(33) දැදිගම සූතිඝර චෛත්‍යයේ සිදු කරනු ලැබූ කැණීම් තුළින් හමු වූ වැදගත් පුරා විද්‍යාත්මක සාධකය වන්නේ,

1. වර්ණාලිප්ත උළු
2. මැටි කොතලයක්
3. වී ඇටයක ප්‍රමාණයේ තැල්ලක කොටසක්
4. ලෝකඩ ඇත් පහන

(34) සමාජ ධූරාවලියක් යන්න අර්ථ දක්වන ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. සමාජයක් තුළ සමාජ ධූරාවලියක් දක්නට ලැබේ.
2. මෙම ධූරාවලියේ ඉහළින්ම සිටින්නේ සාමාන්‍ය ජනතාවයි.
3. ඉහළ සිට පහළට බලය ගලායන ව්‍යුහය සිරස් ධූරාවලියයි.
4. සමාන්තර බලයෙන් යුත් ව්‍යුහය තිරස් ධූරාවලියයි.

පහත සඳහන් කරුණු ඇසුරින් 35 සහ 36 යන ප්‍රශ්නවලට අදාළ පිළිතුරු ගලපන්න.

A - අනුරාධපුර වෙස්සගිරි ලිපිය

B - බදුලු ටැම් ලිපිය

C - මිහින්තලා පුවරු ලිපිය

D - වේවැල්කැටිය සෙල්ලිපිය

(35) වෙළෙඳ පොළක පාලනය සඳහා පනවන ලද නීති සහ මී හරකුන්, එළ හරකුන් සහ එළුවන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම පැණවීමේ නීතිය පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. A C
2. B C
3. C D
4. B D

(36) වැව්වලින් ගොවිතැන් කරන කුඹුරුවල වී මිස මුං ඇට වැපිරීම නොකළ යුතු බව දැක්වෙන හතරවන මහින්ද රජුට අයත් සෙල් ලිපිය වන්නේ,

1. A
2. B
3. C
4. D

(37) වර්තමානයේ ශ්‍රී ලංකාවේ භාවිතා වන නීතිය වනුයේ,

1. අරාබි නීතිය යි.
2. තේසවලාමේ නීතිය යි.
3. රෝම - ලන්දේසි නීතිය යි.
4. බ්‍රිතාන්‍ය නීතිය යි.

(38) අපරාධයක් සිදු කළ අයෙකු අල්ලා ගන්නා තුරු ඔහු ජීවත් වූ ගමේ වැසියන් විසින් රජයට ගෙවිය යුතු වූ බද්ද හැඳින්වූයේ ,

1. බොජකපති
2. මතරමජිබක
3. දකපති
4. ගෘහදණ්ඩ

(39) තෙවරක්ම මෙරට පාලන කටයුතුවලට දායකත්වය දැක්වූ රැජිණ,

1. අනුලා බිසව
2. ලීලාවතී රැජින
3. සුගලා දේවිය
4. චූලසීවලී රැජින

(40) ක්‍රි. පූ. 1129 තරම් ඈත අතීතයේ දී කාන්තාවක් තම ඇස්පිහාටු වර්ණ ගැන්වීම සඳහා භාවිතා කරන ලද ලෝහකූරක් හමු වී ඇති ප්‍රදේශය,

1. රත්නපුර දිස්ත්‍රික්කයේ උඩරංචාමඩමින්
2. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොක්ඇබේ
3. අම්බලන්තොට ගොඩවායෙන්
4. අනුරාධපුර දිස්ත්‍රික්කයේ දුනුමඩලාකන්දෙන්